# ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්

## (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය)

STATE FERTILIZER
රජයේ පොහොර-රටම අස්වද්දන්න

**ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතින පූර්ණ රජය සතු සමාගමකි. ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ පොහොර අවශ්‍යතාවය සපුරාලීම සඳහා අප සමාගම රසායනික පොහොර ආනයනය, ගුණාත්මක මිශ්‍ර පොහොර නිෂ්පාදනය, අලෙවි කිරීම හා බෙදාහැරීම සිදු කරනු ලබන රජය සතු එකම ආයතනය වේ.**

**ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් හි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන ගතික ප්‍රතිඵල කඩිනමින් ළඟාකර ගත හැකි බාහිර/අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය - HM 2-1

| තනතුරු නාමය | රැකියා සාරාංශය හා සපුරාලිය යුතු සුදුසුකම් |
|---|---|
| **සාමාන්‍යාධිකාරී** **(තනතුරු - 01 )** | <u>රැකියා සාරාංශය :</u><br>ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරි ලෙස ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලබන බලතල, කාර්යයන් හා වගකීම්, අධ්‍යක්ෂක මණ්ඩලයේ මගපෙන්වීම හා පරිපාලනය යටතේ ඉටුකරමින්, ආයතනික කාර්ය මණ්ඩලයට නායකත්වය දෙමින්ද කාර්ය මණ්ඩලය දිරි ගන්වමින්ද ආයතනය ඉහලම ඵලදායිතාවය කෙරෙහි යොමුකරවීමද ආයතනයෙහි සමස්ත කාර්ය සාධනය සම්බන්ධයෙන් මූලික වගකීම හා වගවීම් දැරීමද සාමාන්‍යාධිකාරී තනතුරෙහි කාර්යභාරය වේ.<br><u>සුදුසුකම් / පළපුරුද්ද :</u><br><u>බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම 01 හෝ 02)</u><br>01. විද්‍යාව / කෘෂිකර්මය/ ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / අලෙවිකරණය / මානව සම්පත් කළමනාකරණය/ වානිජ හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම<br>සමග<br>ඉහත විෂය ධාරාව යටතේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ අදාල විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.<br>සහ<br>උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)<br>02. විද්‍යාව/ කෘෂිකර්මය/ව්‍යාපාර පරිපාලනය /ව්‍යාපාර කළමනාකරණය/ අලෙවි කරණය/ මානව සම්පත් කළමනාකරණය/ වානිජ හෝ එම විෂයධාරාව ප්‍රධාන වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම සමග ඉහත විෂය ධාරාව යටතේ ආචාර්ය උපාධියක් ලබා තිබීම.<br>සහ<br>ආචාර්ය උපාධියක් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය ව්‍යවසායක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 05ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද.<br>**අභ්‍යන්තර අයදුම්කරුවන්.**<br>ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>සමග<br>බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහිලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාවයක් ලබා තිබීම. |

**වැටුප් පරිමානය :**

HM 2-1 - 2025

රු.161,140 -12 X 4,850 - 219,340 (අංක 1/2025 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව)

- (රජයේ අනුමත දීමනා , භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව ඉන්ධන දීමනාව සමග වෙන්කල වාහනයක්/ ප්‍රවාහන දීමනාවක් සහ සන්නිවේදන දීමනා සඳහා හිමිකම් ලබයි.)

**වයසః**

අවු: 35 ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම් කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි).

## ජ්‍යෙෂ්ඨ කළමනාකාර - HM 1-1 සේවා ගණය

| තනතුරු නාමය | රැකියා සාරාංශය හා සපුරාලිය යුතු සුදුසුකම් |
|---|---|
| **කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>ආයතනික මානව සම්පත් ප්‍රතිපත්ති සැලසුම්කරණය හා සම්පාදනය, සේවක බඳවාගැනීම්, උසස්වීම්, විනය පාලනය, පුහුණු හා සංවර්ධනය, සේවක කාර්යසාධන කළමනාකරණය හා ආයතනික පරිපාලන කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව මෙහෙයවීම.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 01 හෝ 02)**<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය හෝ එම විෂයධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම<br>සමග<br>ඉහත විෂය ධාරාව යටතේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ ඉහත විෂය ධාරාව යටතේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ වරලත් සාමාජිකත්වය ලබා තිබීම<br>සහ<br>රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක, රජය සතු ව්‍යවසායක (SOE) හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.<br>02. ඉහත විෂය ධාරාව යටතේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම<br>සහ<br>රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක, රජය සතු ව්‍යවසායක (SOE) හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම. |
| **කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන)** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ නීතිමය රාමුවට අනුකූලව ප්‍රසම්පාදන සැලසුම් සම්පාදනය, සමාගම විසින් සිදුකරනු ලබන සියළු දේශීය/විදේශීය ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 01 හෝ 02)**<br>01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සැපයුම්දාම කළමනාකරණ / ව්‍යාපාර පරිපාලනය/ වානිජ/ අලෙවිකරණය හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම<br>සමග<br>ඉහත විෂය ධාරාව යටතේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ ඉහත විෂය ධාරාව යටතේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා තිබීම<br>සහ<br>රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක, රජය සතු ව්‍යවසායක (SOE) හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.<br>02. ඉහත විෂය ධාරාව යටතේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම<br>සහ<br>රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක, රජය සතු ව්‍යවසායක (SOE) හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම. |

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සුදුසුකම් 01 හෝ 02)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02 "කළමනාකාර" සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාල ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමානය :**

HM 1-1 -2025

රු. 140,640 -15X 4,100 - 202,140 (අංක 1/2025 දරණ කළමනාකරණසේවා චක්‍රලේඛය ප්‍රකාරව)

- (රජයේ අනුමත දීමනා , භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව ඉන්ධන දීමනාව සමග වෙන්කල වාහනයක්/ ප්‍රවාහන දීමනාවක් සහ සන්නිවේදන දීමනා සඳහා හිමිකම් ලබයි.)

**වයසః**

අවු: 35 ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම් කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි).

## කළමනාකාර සේවා ගණය - MM 1-2

| තනතුරු නාමය | රැකියා සාරාංශය හා සපුරාලිය යුතු සුදුසුකම් |
|---|---|
| **සහකාර කළමනාකරු (පරිපාලන)** **(තනතුරු - 01)** | **රැකියා සාරාංශය :**<br>ආයතනයේ සේවකයින් සම්බන්ධ සියළු පරිපාලන කටයුතු, සේවක සුභසාධනය, යටිතල පහසුකම් හා නීතිමය අනුකූලතාවයන් තහවුරු කරමින් ආයතනය තුළ ප්‍රශස්ත භෞතික හා පරිපාලනමය පරිසරයක් පවත්වාගෙන යාමට අදාල රාජකාරි මෙහෙයවීම ප්‍රධාන කාර්යභාරය වේ.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන්**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම<br>සහ<br>සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම. |
| **සහකාර කළමනාකරු (මානව සම්පත් සංවර්ධන / සේවක සබඳතා)** - **(තනතුරු - 01)** | **රැකියා සාරාංශය :**<br>ආයතනික බඳවාගැනීම්, අනුස්ථාපන, උසස්වීම්, පුද්ගලික ලිපිගොනු සහ සේවක දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම, සේවක විනය, දුක්ගැනවිලි නිරාකරණය, වැටුප් හා ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ, වාර්ෂික පුහුණු සැලසුම්, අයවැය සහ කාර්යසාධන ඇගයීම් මගින් මානව සම්පත් සංවර්ධනය හා සේවක සබඳතා ඵලදායී ලෙස මෙහෙයවීම ප්‍රධාන කාර්යභාරය වේ.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන්**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම<br>සහ<br>සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම. |
| **අභ්‍යන්තර විගණක** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>වාර්ෂික විගණන සැලසුම් සකස් කරමින් අභ්‍යන්තර පාලන පද්ධති, මූල්‍ය රෙගුලාසි, ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවදානම් කළමනාකරණ ක්‍රමවේද සමාලෝචනය කිරීම, විගණන කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම සහ බාහිර/රජයේ විගණන ආයතන සමග අනුකූලතාව පවත්වා ගැනීම.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 01 හෝ 02)**<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණ/ වානිජවේදී / මූල්‍ය/ ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රයේ උපාධියක් හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම<br>සහ<br>සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.<br>02. ඉහත විෂය ධාරාව යටතේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම. |
| **සහකාර කළමනාකරු (නිෂ්පාදන) .** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>නිෂ්පාදන සැලැස්මට අනුව මිශ්‍රණ පොහොර නිෂ්පාදනය, සෘජු පොහොර තොග පවත්වාගෙන යාම සහ මෙහෙයුම් කටයුතුවලට අදාල සියළුම රාජකාරි මෙහෙයවීම සම්බන්ධීකරණය කිරීම.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන්**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සැපයුම්දාම කළමනාකරණ/ සැපයුම් හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ/ විද්‍යා/ ව්‍යාපාර කළමනාකරණය හෝ එම විෂයධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම<br>සහ<br>උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම |
| **සහකාර කළමනාකරු (විකුණුම්) .** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>ආයතනයේ අලෙවි ඉලක්ක සපුරාගැනීම සඳහා පොහොර අලෙවි මෙහෙයුම් කටයුතු විධිමත්ව පාලනය කිරීම, ක්ෂේත්‍ර නිලධාරීන් අධීක්ෂණය, ප්‍රාදේශීය ගබඩාවන්හි යටිතල පහසුකම් හා ගෙවීම් කටයුතු අධීක්ෂණය, රේඛීය අමාත්‍යාංශය, ජාතික පොහොර ලේකම් කාර්යාලය හා වෙනත් රාජ්‍ය ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමට අදාල රාජකාරි මෙහෙයවීම ප්‍රධාන කාර්යභාරය වේ<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 01 හෝ 02)**<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය / විද්‍යා/ කෘෂිකර්මය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම<br>සහ<br>උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.<br>02. ඉහත විෂය ධාරාව යටතේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම. |

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සුදුසුකම් 01 හෝ 02)**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02."කණිෂ්ඨ කළමනාකාර"සේවා ගණයෙහි අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමානය :**

MM 1-2-2025

රු. 94,170 - 10 X 2,480 , 15 X 3,450 -170,720

(අංක 1/2025 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව)

(රජයේ අනුමත දීමනා සහ භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව සන්නිවේදන දීමනා සඳහා හිමිකම් ලබයි).

**වයසః**

අවු: 22 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම් කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි).

## කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය - JM 1-1

| තනතුරු නාමය | රැකියා සාරාංශය හා සපුරාලිය යුතු සුදුසුකම් |
|---|---|
| **කණිෂ්ඨ කළමනාකරු (නිෂ්පාදන හා මෙහෙයුම්)** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>ප්‍රාදේශීය ගබඩා සහ අලෙවි අංශය වෙතින් ලැබෙන පොහොර ඇණවුම් අනුව පොහොර අවශ්‍යතා කඩිනමින් බෙදාහැරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම හා ප්‍රවාහන නියෝජිතයින් සම්බන්ධීකරණය කිරීම, පොහොර බෙදාහැරීම / මිශ්‍ර පොහොර නිෂ්පාදනය පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම හා අඛණ්ඩව නිෂ්පාදනය පිළිබඳ අධීක්ෂණය.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන්**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සැපයුම්දාම කළමනාකරණ/ සැපයුම් හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ/ විද්‍යා/ ව්‍යාපාර කළමනාකරණය හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම. |
| **සභාපතිගේ ලේකම්** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>සභාපති කාර්යාලයේ නිල කටයුතු, කාලසටහන්, හමුවීම්, රැස්වීම් පූර්ව සංවිධානය කිරීම, විද්‍යුත් තැපැල හා අතිශය රහස්‍ය ලේඛන විධිමත්ව කළමනාකරණය කරමින් අභ්‍යන්තර හා බාහිර සේවාදායකයින් සමග වෘත්තීය සන්නිවේදනයක් පවත්වා ගැනීම ප්‍රධාන කාර්යභාරය වේ.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 01 හෝ 02 )**<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය/ මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය හෝ වානිජ/කලා හෝ එම විෂයධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම.<br>02. තෘතියික හෝ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු/ වරලත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාල විෂය ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක්/ උසස් ඩිප්ලෝමාවක් සමග අදාල විෂය ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05)ක පළපුරුද්ද ලබා තිබීම. |
| **කණිෂ්ඨ කළමනාකරු (මූල්‍ය)** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>ආයතනයේ ගිණුම්කරණ හා මූල්‍ය පාලන කටයුතු විධිමත්ව මෙහෙයවමින්, ගෙවීම්, ආදායම්, බැංකු සැසඳීම්, ව්‍යවස්ථාපිත ගෙවීම්, වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු හා අවසාන ගිණුම් සකස් කිරීමට සහාය වීම ඇතුළු ගිණුම්කරණ හා මූල්‍ය පාලන කටයුතු නියමිත කාලසීමාවන් තුළ නිරවද්‍යව ඉටුකිරීම.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් 01 හෝ 02)**<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණ/ මූල්‍ය/ වානිජවේදී/ ව්‍යාපාර පරිපාලනය හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් ලබා තිබීම.<br>02. ඉහත විෂය ධාරාව යටතේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම. |
| **කණිෂ්ඨ කළමනාකරු (තොරතුරු හා තාක්ෂණ)** **(තනතුරු- 01)** | **රැකියා සාරාංශය :**<br>ආයතනයේ මෘදුකාංග, දෘඩාංග, පරිගණක ජාලකරණය (Networking), අන්තර්ජාල පහසුකම් හා පද්ධති ආරක්ෂණ මෘදුකාංග (Virus Guard) අඛණ්ඩව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ පද්ධති දෝෂ කඩිනමින් නිරාකරණය කිරීම.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 01 හෝ 02 හෝ 03 හෝ 04)**<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.<br>02. තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>03. තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>සහ<br>සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක, රාජ්‍ය ව්‍යවසායක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.<br>04. තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස් (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක, රාජ්‍ය ව්‍යවසායක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර දහයක (10) ක පළපුරුද්දක් ලබා තිබීම. |

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සුදුසුකම් 01 හෝ 02)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02 "කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන" සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාල විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සැ.යු -** කණිෂ්ඨ කළමනාකරු (තොරතුරු හා තාක්ෂණ) තනතුර සඳහා කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA -2:1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමානය :**

JM 1-1 -2025

රු. 72,650 - 10 X 1,360 - 18 X 2,040 - 122,970

(අංක 1/2025 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව)

(රජයේ අනුමත දීමනා සහ භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව සන්නිවේදන දීමනා සඳහා හිමිකම් ලබයි).

**වයසః**

අවු: 22 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම් කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි).

## ප්‍රාථමික ශිල්පීය (PL-3) සේවා ගණය

| තනතුරු නාමය | රැකියා සාරාංශය හා සපුරාලිය යුතු සුදුසුකම් |
|---|---|
| **ෆෝක්ලිෆ්ට් (Forklift) ක්‍රියාකරු** **තනතුරු -02** | **රැකියා සාරාංශය :**<br>පොහොර තොග නිෂ්පාදන කටයුතු සහ මෙහෙයුම් කටයුතුවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සහ නිමි භාණ්ඩ ප්‍රවාහනය,බෑම සහ පැටවීම ආරක්ෂිතව සහ නියමිත ප්‍රමිතියට අනුව සිදු කිරීම.<br>**සුදුසුකම් / පළපුරුද්ද :**<br>**බාහිර අයදුම්කරුවන් -**<br>ශිල්පීය නිපුණතා.<br>තනතුරෙහි කාර්ය භාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතරවැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.<br><u>අභ්‍යන්තර අයදුම්කරුවන් –</u><br>අදාල ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාල තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්<br>හෝ<br>තනතුරෙහි කාර්ය භාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. |

**වැටුප් පරිමානය :**

PL-3 - 2025 - රු. 43,280 - 10 X 490 ,10 X 540 , 10 X 590 , 12 X 630 - 67,040

(අංක 1/2025 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව)

(රජයේ අනුමත දීමනා )

**වයසః**

අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි).

**වෙනත්:**

සෑම ඉල්ලුම්කරුවකුම

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**ඉහත තනතුරු සඳහා වැටුප්/දීමනා වලට අමතරව පහත සඳහන් වරප්‍රසාද හිමි වේ.**

- සේවක අර්ථ සාධක අරමුදල (EPF) සඳහා සමාගම විසින් 15% දායකත්වයක් ලබා දෙන අතර, සේවක භවතාගේ දායකත්වය 10%කි.
- සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF) සඳහා සමාගම විසින් සේවක භවතාගේ වැටුපෙන් 3% ක දායකත්වයක් දරනු ලබයි.
- සේව්‍ය හා සේවක දෙපාර්ශවයේ දායකත්වයෙන් සේවක භවතා හා පවුලේ සාමාජිකයන් ඇතුලත් වන පරිදි වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමයේ දායකත්වය.

**අයදුම්පත් යොමු කිරීම:**

අදාල සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් විසින් එකී සුදුසුකම් සඳහන් කර අයදුම්පතක් 2026.11.12 දින හෝ එදිනට පෙර මා වෙත ලබාදීමට කටයුතු කරන ලෙස දන්වමි.

- සුදුසුකම්ලත් බාහිර අයදුම්කරුවන් ජීව දත්ත තොරතුරු ඇතුලත්ව නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකවල සහතික කරන ලද පිටපත් සමග 2026.11.12 දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් (ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර) අප වෙත ලැබීමට සැළැස්විය යුතු අතර, දනට රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, රජය සතු සමාගම්වල සේවයේ නියුතු සේවක භවතුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අදාල ආයතන ප්‍රධානී මගින් යොමුකල යුතුය.
- ඉහත පරිදි යොමු කරනු ලබන අයදුම්පතෙහි පිටපතක් general@statefertilizer.lk යන ඊ මේල් ලිපිනය වෙතද යොමු කළ යුතු අතර, ඊ මේල් යොමු කිරීමේදී Subject තීරුවෙහි ඔබ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- අසම්පූර්ණ, අදාල සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සුදුසුකම් සහිත හා කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය:**

**සභාපති,**
**ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්,**
**ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත,**
**හුණුපිටිය, වත්තල.**

gazette.lk SINCE 2014 AMBITIONS REALIZED